# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2166/7 – 2020 මාර්තු 10 වැනි අඟහරුවාදා – 2020.03.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/03/2017/93.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2019.03.07 වැනි දින අංක 2113/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.28 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. කේ. උපාලි රූපසිංහ මයා, අංක 24/2, ලියනගේ මාවත, නාවල පාර, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර පවත්නා 2019.01.26 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

1A – G 32186 – 26(2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.02.28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

03 - 918/1

---

මගේ අංකය: IR/COM/03/2017/93.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. කේ. උපාලි රූපසිංහ මයා, අංක 24/2, ලියනගේ මාවත, නාවල පාර, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/F, වී. ජයරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/93.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. කේ. උපාලි රූපසිංහ මයා, අංක 24/2, ලියනගේ මාවත, නාවල පාර, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකන් එයාර්ලයින් ලිමිටඩ් හි සේවයේ නියුතු එන්. කේ. උපාලි රූපසිංහ මයා හට,

1. දීර්ඝ විදේශීය සේවා පළපුරුද්දක් සහිතව 1998.02.20 දින EV ශ්‍රේණියේ විධායක ඉංජිනේරුවරයෙකු ලෙස සේවයට එක්වී 2001.04.01 දින සිට 9 වන ශ්‍රේණියේ කළමණාකරුවෙකු ලෙස උසස්වීම ලැබීමෙන් අනතුරුව මේ දක්වා උසස්වීම් ලබා නොදීම.

2. සේවයට එක්වන අවස්ථාවේදී මාසිකව පෙට්‍රල් ගැලුම් 30 ක වටිනාකමට සමාන මුදලක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලබා දුන් වරප්‍රසාද 1999.10.01 දින සිට කිසිඳු දැනුම් දීමකින් තොරව අත්හිටුවීම.

3. 1999.11.23 දිනැති චක්‍රලේඛය මගින් ලබා දුන් 40% ක වැටුප් වැඩි කිරීම 20% බැගින් වාරික 2 කින් අනෙකුත් සියලුම සේවකයන්ට ලබා දුන්න ද පැමිණිලිකරුට 20% ක පළමු වැඩිවීම පමණක් ලබා දී දෙවැනි 20% ක වැඩිවීම ලබා නොදීම.

4. පැමිණිලිකරු සේවයට පැමිණි දින සිට ලබා දුන් රු. 5000/- ක පොරොන්දු දීමනාව (On - Call Allowance) 2011.01.01 දින සිට අහිමි කිරීම.

යන කරුණු මගින් යම් අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 918/2

මගේ අංකය : IR/COM/03/2017/193.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.09.17 වැනි දින අංක 2089/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.29 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්.ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2018.08.16 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.08.29 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

03 - 919/1

---

මගේ අංකය: IR/COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්.ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බඳුල්ල සිල්වර්ලෑන්ඩ්, හිඟුරුගමුව පාර ''සෞම්‍යා'' අංක 417, ඩී.එම්.කරුණාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්.ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකු වශයෙන් සේවය කරන එම්. ජේ.චන්ද්‍රතිලක මහතාට අදාළ ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ලබාදිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 919/2

මගේ අංකය : IR/COM/02/2017/182.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.05.23 වැනි දින අංක 2072/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.05.15 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, අංක 513-2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05. (සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, අංක 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02. 2. ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 309/6, මීගමු පාර, වැලිසර.

අතර පවත්නා 2018.05.04 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.05.15 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

03 - 920/1

---

මගේ අංකය: IR/COM/02/2017/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, අංක 513-2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05. (සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, අංක 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
02. ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 309/6, මීගමු පාර, වැලිසර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, ටොරින්ටන් මාවත, ටොරින්ටන් ෆ්ලැට්ස්, K 77, පී. මහාදේව මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, අංක 513-2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05. (සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, අංක 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
2. ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 309/6, මීගමු පාර, වැලිසර.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ෆින්ලේස් කලම්බු ලිමිටඩ් හා ෆින්ලේ ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන දෙකෙහිම සේවය කල පහත නම් සඳහන් සේවකයින් 18 දෙනාගේ සේවය ඒ ඒ ආයතනයන් විසින් විනය කරුණු මත අවසන් කිරීමෙන් ඔවුන් 18 දෙනාට අසාධාරණයක් සිදුව තිබේ ද එසේ සිදුව තිබේ නම් ඔවුන්ට හිමි සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

| | |
|---|---|
| 01. වේලායුදන් | 10. එස්. ආර්. රොසයිරෝ |
| 02. ඩබ්ලිව්. ජී. බී.කමල් ජයසේන | 11. ඩබ්ලිව්. එම්. විජිත විජේසිංහ |
| 03. ඩී.එම්.තීක්ෂණ | 12. ඊ. ඩී. සුමිත් රණසිංහ |
| 04. කේ. ඒ. නිමලසිරි | 13. එස්. වික්‍රමසිංහ |
| 05. එන්. බාලසුප්‍රමනියම් | 14. ජේ.එම්.ඩී.එන්. ප්‍රියංකර |
| 06. සරත් ගුරුගේ | 15. එල්.ඩී. සී.එන්. කුමාර |
| 07. ආර්.ආර්.පත්මසිරි | 16. පී.බී.එස්. ගුණරත්න |
| 08. ජේ.එස්.ජේ. ප්‍රනාන්දු | 17. ආර්.ඩී.දමින්ද |
| 09. ආර්.සී.ඩබ්.කේ. සිල්වා | 18. මෙලන් ෆැන්සිස් |

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 920/2

*මගේ අංකය*: IR/COM/03/2018/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රියන්ති රේණුකා පීරිස් මිය, අංක 90/A, මෙන්දිස් පාර, විල්ලෝරාවත්ත, මොරටුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, අංක 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,
කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, නො. XB - 10-1-2, ඩී.ජී.කේ.කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/03/2018/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රියන්ති රේණුකා පීරිස් මිය, අංක 90/A, මෙන්දිස් පාර, විල්ලෝරාවත්ත, මොරටුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, අංක 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ කළමනාකාරිණියක ලෙස සේවය කරන ප්‍රියන්ති රේණුකා පීරිස් මහත්මියට 2012 ඔක්තෝබර් මස සිට රු. 10,000/- ක ප්‍රවාහන දීමනාව නොලැබීමෙන් සහ 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි JM 1-1 වැටුප් තලයේ නොපිහිටුවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් කුමන සහනයක් හිමිවිය යුතු'' ද යන්න පිළිබඳව වේ'' .

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 921

## නිවැරදි කිරීමයි

*මගේ අංකය*: IR/COM/02/2017/97.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

2019.11.11 දිනැති අංක 2149/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සිංහල භාෂා පිටපතේ ''ජේ.කේ. ද සිල්වා මයා සහ එතිහැඩ් එයාවේස්'' අතර පවත්නා කාර්මික ආරාවුල පළවූ 6A පිටුවේ 4(1) වගන්තිය යටතේ නියෝගයේ බේරුම්කරුගේ නම මුද්‍රණ දෝෂයකින් ''ඕබඩගේ තිලකරත්න'' ලෙස පළවී ඇත. එය ''ඕබඩගේ ලීලාරත්න'' ලෙස නිවැරදි විය යුතුය.

කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත,
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට.

2020 පෙබරවාරි මස 05 වැනි දින.

03 - 946

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.